৷

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2286/13 – 2022 ජුනි මස 27 වැනි සඳුදා – 2022.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරීන් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535A, බෙල්ලන්විල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බෙල්ලන්තර (බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක CO/KSB/2021/574 දරන පුගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කදුරුගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4123ක් පමණ**

උතුරට: දෙහිවල පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, දෙහිවල පාරේ වරි. අංකය සොයාගත නොහැකි බෙල්ලන්විල රජමහා විහාරය හිමිකම් කියන ඉඩම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි කදුරුගහ කුඹුර; නැගෙනහිරට සහ දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කදුරුගහ කුඹුර; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි කදුරුගහ කුඹුර, දෙහිවල පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, දෙහිවල පාරේ වරි. අංකය සොයාගත නොහැකි බෙල්ලන්විල රජමහා විහාරය හිමිකම් කියන ඉඩම.

හරීන් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/13/2021/BA/ 183.
2022 ජුනි මස 02 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 06 - 0207